# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.02 පැය 2150 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/626/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

### මාරක රිය අනතුරක් - කැකිරාව පොලිස් වසම

2025.04.02 වන අද දින දහවල් කාලයේ කැකිරාව පොලිස් වසමේ මහනුවර යාපනය මාගර්යේ ඔළුකරඳ දුම්රිය හරස් මාගර්ය ආසන්නයේදී අනුරාධපුර දෙස සිට කැකිරාව දෙසට ධාවනය වූ ත්‍රිරෝද රථයක් මාගර්යේ දකුණු පසට ඇති අතුරු මාගර්යකට හැරවීමට යාමේදී එම දෙසටම ත්‍රිරෝද රථයට පිටුපසින් ධාවනය වූ බස් රථයක් ත්‍රිරෝද රථයේ පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථයේ රියදුරු, පිටුපස අසුනේ ගමන් කළ රියදුරුගේ බිරිඳ සහ දරුවන් දෙදෙනා බරපතල තුවාල ලබා කැකිරාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු බිරිඳ මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 39 ක් වූ ඔළුකරඳ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

තුවාල ලැබූ වයස අවුරුදු 44 ක් වන ත්‍රිරෝද රථයේ රියදුරු කැකිරාව රෝහලේ ප්‍රතිකාර ලබන අතර , වයස අවුරුදු 11 වන පිරිමි දරුවා සහ වයස අවුරුදු 12 ක් වන ගැහැණු දරුවා වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට මාරු කර යවා ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වයස අවුරුදු 27 ක් වන බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කැකිරාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**